# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,395 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2008 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2021 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අගෝස්තු මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


2005- B 82592 — 5,403 (2024/07)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

### 2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

### 3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

### 4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

### 5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

### 6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

### 8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අධිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරින් හට හමුදා අධ්‍යයන ඩිප්ලෝමාව පිරිනැමේ. ඔවුන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයේ අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. *මූලික සුදුසුකම් :*

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | විවාහක/අවිවාහක බව | : | අවිවාහක |
| ඇ. | වයස | : | 2024 අගෝස්තු මස 30 දිනට වයස අවුරුදු 18 ත් 24ත් අතර විය යුතුයි. |
| ඈ. | උස | : | අඩි 5 යි අඟල් 6 ට (167.5 cm) නොඅඩු විය යුතුයි. |
| ඉ. | බර | : | කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතුයි. |
| ඊ. | පපුව | : | අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | : | 6/6 විය යුතුය (උපැස් සහ කාච රහිතව). |
| ඌ. | ශරීර ස්කන්ධ දර්ශකය | : | 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතුය. |

4. අධ්‍යාපන සුදුසුකම් :

අ. අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයන් 03ක් සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම;

*සහ*

ආ. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමඟ විෂයයන් අටක් (08) සමත්වීම (විද්‍යාව විෂය ඇතුළුව)
හා තෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම

*හෝ*

ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් NVQ Level - 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඩිප්ලෝමා/උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය).

*හෝ*

ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාගවලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය; (ඉහත අනිවාර්ය විෂයයන් ද ඇතුළුව).

5. වෙනත් සුදුසුකම් : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. පොදු :

අ. පුහුණුවීම් ලබන කාලය තුළ දී කෙඩෙට් නිලධාරීන් හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

ආ. මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයේ සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතුය.

7. සේවා කොන්දේසි :-

අ. පුහුණු කාල සීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන් ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතුය. ඒ සඳහා යුද්ධ හමුදාව සමග ඇප බැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

ආ. පුහුණුවීම් ලබන කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප රු. 91,551.80 කි (සියලු දීමනා සහිතව). කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළ දී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

ඇ. කෙඩෙට් නිලධාරීන් හට ශ්‍රී ලංකාවේ දී මාස 12ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණුවීම්වල නිරත වීමට සිදුවේ.

ඈ. පුහුණුවීමේ කාලය තුළ දී කෙඩෙට් නිලධාරීන්ගේ තරාතිරම සෙසු නිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

ඉ. පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම.

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන් ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුණු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතු ව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතුන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්‍ෂක නිශ්කාෂණ, තමන් විසින් වලක්වාලිය හැකි හේතුන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුණු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතුන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

8. *වැටුප් හා දීමනා.-*
ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාමේ නිලධාරීන් වශයෙන් දෙවන ලුතිනන්වන ආරම්භක නිලයෙ හි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙ හි/පරිමාණයෙ හි තබනු ලැබේ :

| අ/අ | නිලය | රාජ්‍ය කළමණාකරන චක්‍රලේඛ 3/2016 ට අනුව | | |
|---|---|---|---|---|
| | | ඒකාබද්ධ වැටුප 2020 වර්ෂයේ සිට | වැටුප් වර්ධක 2020.01.01 දින සිට | උපරිම ඒකාබද්ධ වැටුප |
| 1 | දෙවන ලුතිනන් | රු. 41,905.00 | - | - |
| 2 | ලුතිනන් | රු. 47,615.00 | 30 x 1335 (වාර්ෂික) | රු. 87,665.00 |
| 3 | කපිතාන් | රු. 55,625.00 | 24 x 1335 (වාර්ෂික) | රු. 87,665.00 |
| 4 | මේජර් | රු. 60,965.00 | 22 x 1335 (වාර්ෂික) | රු. 90,335.00 |
| 5 | ලුතිනන් කර්නල් | රු. 62,595.00 | 22 x 1630 (වාර්ෂික) | රු. 98,455.00 |
| 6 | කර්නල් | රු. 76,175.00 | 17 x 2170 (වාර්ෂික) | රු. 113,065.00 |
| 7 | බ්‍රිගේඩියර් | රු. 80,515.00 | 15 x 2170 (වාර්ෂික) | රු. 113,065.00 |
| 8 | මේජර් ජෙනරාල් | රු. 88,000.00 | 12 x 2700 (වාර්ෂික) | රු. 120,400.00 |
| 9 | ලුතිනන් ජෙනරාල් | රු. 93,400.00 | 10 x 2700 (වාර්ෂික) | රු. 120,400.00 |
| 10 | ජෙනරාල් | රු. 101,500.00 | 7 x 2700 (වාර්ෂික) | රු. 120,400.00 |

9. අනෙකුත් දීමනා : පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ.

අ. සුදුසුකම් දීමනා.

ආ. නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව.

ඇ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරීන්ට පමණක්).

ඈ. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

අ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.

ආ. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී.

ඇ. නොමිලේ නිල ඇඳුම්.

ඈ. විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන් අනුගාමික සේවය.

ඉ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපත්‍රයක්

11. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරින්ට බලපවත්වනු ලැබේ :

අ. යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

ආ. 1993 අගෝස්තු මස 17 වැනි දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරී (නිත්‍ය බලසේනා) සේවා නියෝගය.

ඇ. 1989 ජුනි මස 15 වැනි දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

12. මෙහි පහත 13 වැනි ඡේදයෙ හි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂිකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙ හි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයත් සමග ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. විශේෂ අවස්ථාවල දී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

13. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරී ඉල්ලුම්කරුවෙකුවන ..........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

ආ. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළ දී අයදුම්කරුහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන් ම අධිකාරය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදු වූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින් ම වලක්වාලිය හැකි හේතූන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* නොගැලපෙන වචන කපා හරින්න.

..................,

මව/පියා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :.....................................................

දිනය :..................

සාක්ෂිකරුගේ අත්සන :..................

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :.....................................................

14. භාෂා අවශ්‍යතා :
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික දී සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාර ව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතුවේ.

15. අනන්‍යතාවය තහවුරු කිරීම :
අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 'රියදුරු බලපත්‍රය' පිළිගනු ලැබේ.

16. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අපේක්ෂකයා මුදවාලිය හැකි බවට සහතිකයක් ද සහිත ව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුයි.

17. ඉල්ලුම් පත්‍ර.-
ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේ ම අත් අකුරින් ලියා **2024.08.05** දින දහවල් **12.00** පැයට හෝ ඊට පෙර ලැබෙන සේ ''පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ'' යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ ''යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙටි කාලීන කෙඩෙට් නිලධාරී පාඨමාලාවේ කෙඩෙට් නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට පෙර හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

18. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය:

අ. උප්පැන්න සහතිකය,

ආ. ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික,

ඇ. පාසල් හැරයාමේ සහතිකය,

ඈ. ග්‍රාම නිලධාරී සහතිකය,

ඉ. පොලිස් නිශ්කාෂණ සහතිකය,

ඊ. ක්‍රීඩා හා විෂයය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

උ. අයදුම්කරු පිළිබඳ දන්නා (චරිත සහතිකයක් නිකුත් කළහැකි අයෙකුගෙන්) පුද්ගලයින්ගෙන් මෑතක දී ලබාගන්නා ලද චරිත සහතික යටත් පිරිසෙන් දෙකක් හා අයදුම්කරු අවසාන වරට ඉගෙනීම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබාගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතුවේ.

ඌ. අදාළ වෙනත් සහතික.

එ. තවද, ජාතික හැඳුනුම්පතෙ හි ඡායා පිටපතක් ද මෑතක දී ලබාගත් 2" x2"x1/2 ප්‍රමාණයේ ඡායාරූපයක්, ග්‍රාම නිලධාරී හෝ නීතිඥවරයෙකු විසින් සහතික කර එව්ය යුතුය.

19. සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම.- ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටිය යුතුයි. ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

20. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

21. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වේ.

22. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

***සටහන*** : මෙම නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

එච් එල් වී එම් ලියනගේ ආර්ඩබ්ලිපී ආර්එස්පී එන්ඩීයූ
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2024 ජූලි මස 08 වැනි දින.
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර,
කොළඹ.

| | | |
|---|---|---|
| APPLICATION FOR OFFICER CADET VACANCIES (SHORT COURSE) OF SRI LANKA ARMY REGULAR FORCE | a. FOR OFFICIAL USE | 2" x 2.5" size Colour Photograph |

**PERSONAL DETAILS**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| b. | Name with Initials | | | | | | | |
| c. | Name you prefer to be called | | | | | | | |
| d. | Full Name | | | | | | | |
| e. | **Contact Nos** | Mobile | | Email Address | | | | |
| | | Home | | | | | | |
| f. | Date of Birth | / / | | Age as at 30 August 2024 | Y | M | D | |
| g. | **Height** | cm | Chest | inch | Weight | Kg | Sex | |
| h. | **N.I.C./ Driving Licence/ Passport No.** | | | | | | | |
| i. | Postal Address | | | | | | | |
| j. | **Marital Status** | | Province | | District | | | |
| k. | ED & Letter | | | GN Division & No. | | | | |

**BASIC EDUCATIONAL QUALIFICATIONS**

| | | |
|---|---|---|
| l. | **GCE (O/L) or Equivalent Exam** | |
| | Name of the School (s) | |

| **Ser** | **Subjects** | **Attempt** | First | Second | Third |
|---|---|---|---|---|---|
| | | **Year** | 20 ........... | 20 ............ | 20 ............. |
| | | **Index No.** | | | |
| 1 | English | | | | |
| 2 | Mathematics | | | | |
| 3 | Sinhala/ Tamil | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |

m.

| **GCE (A/L) or Equivalent Exam** | | | | | |
|---|---|---|---|---|---|
| Name of the School (s) | | | | | |
| | | | | | |
| **Ser** | **Subjects** | **Attempt** | First | Second | Third |
| | | **year** | 20 ........... | 20 ............ | 20 ............. |
| | | **Index No.** | | | |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | General English | | | | |
| 6 | Common General Test | | | | |
| 7 | Z- score | | | | |
| 8 | University Entrance (**Yes/No**) | | | | |

n.

| **Other Academic Qualifications** | | | | | |
|---|---|---|---|---|---|
| Ser | Description | Institute | Duration | | Grading |
| | | | From | To | |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

**OTHER QUALIFICATIONS**

o.

| **Sports Activities** | | | | | |
|---|---|---|---|---|---|
| Ser | Description | Achievement | | | |
| | | School | Regional | National | International |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |

p.

| **Leadership Activities** | | | | | |
|---|---|---|---|---|---|
| Ser | Description | Achievement | | | |
| | | School | Regional | National | International |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |

q.

| **Extracurricular Activities** | | | | | |
|---|---|---|---|---|---|
| Ser | Description | Achievement | | | |
| | | School | Regional | National | International |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |

**OTHER IMPORTANT DETAILS**

r.

| **Records of Previous service in Armed Services (if any)** | | | | Armed Service | | | |
|---|---|---|---|---|---|---|---|
| Svs No. | | Rank | | Duration | | to | |
| Reason for Discharge/ Resign | | | | | | | |
| | | | | | | | |

s.

| **Details of Occupation (If any)** | | Svc No. | | Position | |
|---|---|---|---|---|---|
| Employer | | | | | |
| Contact Person & Number | | | | | |
| I declare that if the applicant named above is selected, he can be released from the current employment. | | | | | |
| Name of Authorised Person | | | | | |
| | | | | | Signature & Stamp |

t.

| Dual Citizenship (If any) | Country | | From | | To | |
|---|---|---|---|---|---|---|

u. **Have you ever applied for any position in the Tri-Services/ Police or any other Armed Service? (if any)**

| Ser | Armed Service | Date | Position | Present Status | Reason for Disqualification |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

v. **Family Details :**

| Ser | Relationship | Name with Initials | Occupation | Employer |
|---|---|---|---|---|
| 1 | Father | | | |
| 2 | Mother | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

w.

| **Name and contact Number of NOK** | | |
|---|---|---|

x.

| Details of Blood relatives who serve (d) the Sri Lanka Army | | | | | | |
|---|---|---|---|---|---|---|
| Ser | Svs No. | Rank | Name | Relationship | Regiment | Present Status |
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |

y.

| Have you or any of your close relatives ever been convicted or found guilty or have any pending court cases against at any Court of Law? (If any, provide full particulars of each case) |
|---|
| |

z.

| Details of two non-relatives who know your character and qualifications very well | | | |
|---|---|---|---|
| Name (1) | | | |
| Postal Address | | | |
| | | Contact No. | |
| N.I.C/ Driving License No. | | Occupation | |
| Place of Work | | | |

| | | | |
|---|---|---|---|
| Name (2) | | | |
| Postal Address | | | |
| | | Contact No. | |
| N.I.C/ Driving License No. | | Occupation | |
| Place of Work | | | |

I declare on my honour that the answers I have provided to the questions are correct to the best of my knowledge and belief.

| aa. | Date | | | / | | | 2 | 0 | 2 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|

.....................................................

Signature

ab.

| Document Attached | | | |
|---|---|---|---|
| **Ser** | **Type of Document** | **Attached** | **Not Attached** |
| 1 | N.I.C/ Driving License/ Passport (Copy) | | |
| 2 | Birth Certificate (Copy) | | |
| 3 | G.C.E. (O/L) Certificates (Copy) | | |
| 4 | G.C.E. (A/L) Certificates (Copy) | | |
| 5 | Other Educational Qualification Certificates (Copy) | | |

ac.

| In case of insufficient space, use this space or separate sheet and provide additional details. |
|---|
| |

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

### නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අගෝස්තු මස 26** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්ලිව්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 ජූලි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| නුවරඑළිය | නුවරඑළිය | නුවරඑළිය කඳපොල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

07-646

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

## නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අගෝස්තු මස 26** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්ලිව්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 ජූලි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | අඹගමුව | අඹගමුව කෝරළය කොට්ඨාසයේ බගවන්තලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

07-645

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මන්නාරම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අගෝස්තු** මස **26** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 ජුනි මස 02 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | මුසලි | මුල්ලිකුලම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මුසලි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |

07-644

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය

**ආධුනිකයින් ඇතුළත් කරගැනීම - 2024 වර්ෂය**

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2024 වර්ෂය සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම පිණිස මෙහි දෙවන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අවම සුදුසුකම් :

(අ) වයස :- 2024.08.26 දිනට අවුරුදු 16ත් 25ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :-
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් 06ක්, ඕනෑම විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිත ව එක් වරක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

03. පුහුණු පාඨමාලා :

ආධුනික පුහුණුවට තෝරා ගනු ලබන ආධුනිකයින්ට පහත සඳහන් වෘත්තීන් හා එම වෘත්තීන්ට අදළ කාලසීමාවට යටත්ව පාඨමාලාව හැදෑරීමට ඉඩ සලසනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් පාඨමාලා සඳහා ආධුනිකයින් තෝරා ගනු ලබන අතර තෝරා ගනු ලබන ආධුනිකයින් ගණන ද ඉදිරියෙන් දක්වා ඇත.

| | පාඨමාලාව | කාලය | මට්ටම | ආධුනිකයින් ගණන |
|---|---|---|---|---|
| i. | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී | - අවුරුදු 03 | (N. V. Q. Level 04) | -30 |
| ii. | පෑස්සුම් ශිල්පී | - අවුරුදු 03 | (N. V. Q. Level 04) | -25 |
| iii. | විදුලි ශිල්පී (බල) | - අවුරුදු 03 | (N. V. Q. Level 04) | -30 |
| iv. | යන්ත්‍ර ශිල්පී | - අවුරුදු 03 | (N. V. Q. Level 04) | -25 |

04. අයදුම්පත් :-

අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව මි. මී. 297 x 210 ( A-4) ප්‍රමාණයේ සුදු කඩදසියක පිළියෙල කරගත් අයදුම්පත්වල සම්පූර්ණ විස්තර නිවැරදි ව සඳහන් කළ යුතුය. අවශ්‍ය සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. පාඨමාලා සඳහා තෝරා ගැනීම :

(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් පාඨමාලා සඳහා තෝරාගැනීම සිදුකරන අතර, අවශ්‍ය ම අවම සුදුසුකම් ඇති හා 07 වන ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(2) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දනුම, සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා පදනම යටතේ ප්‍රායෝගික/සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

(3) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල දී වැඩිම මුළු ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පුහුණුව සඳහා තෝරා ගන්නා අතර, මූලික කර්මාන්තශාලා පුහුණුවෙන් පසු පැවැත්වෙන පරීක්ෂණයේ ලකුණු, එම කාලය තුල පැමිණීම, දක්වන කුසලතා, පොදු පරීක්ෂණයේ ප්‍රතිඵල හා සිසුන්ගේ කැමැත්ත යන සියල්ල සලකා සිසුන් එක් එක් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

06. විභාග මාධ්‍ය :- ඉල්ලුම් කිරීම අනුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

07. විභාග ගාස්තු :

මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 1000 විභාග ගාස්තුවක් අය කෙරේ. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-2-9027313ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය) ලදුපත අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතුය.

08. විභාග මධ්‍යස්ථාන :

සියලුම අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් රත්මලාන මධ්‍යස්ථානයක දී පමණක් පැවැත්වේ.

09. ගිවිසුම අත්සන් කිරීම :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් වෘත්තියට අදළ කාල සීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදරන බවට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

10. පුහුණුවෙන් පසු ආධුනිකයින්ට රැකියා ලබා දීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

11. පහත දක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්පත් පිළියෙල කර ''නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු හා මානව සම්පත් සංවර්ධන), ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය, කල්දේමුල්ල පාර, රත්මලාන.'' වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලං.ජ.දු.කා.අ.ම./2024'' යනුවෙන් සඳහන් කළ යුතුය. සියළු දැනුම්දීම් වට්සැප්, විද්‍යුත් තැපැල මගින් පමණි සිදුවන බැවින් එම දුරකථන අංක හා විද්‍යුත් තැපැල් ලිපිනයන් පැහැදිලිව හා නිවැරදිව දන්වා එවන්න.

12. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :

අයදුම්පත් **2024.08.26** වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. එස්. මුදලිගේ,
දුම්රිය සාමාන්‍යාධිකාරී. (වැ. බ.)

2024 ජූලි මස 08 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
ශ්‍රී ලංකා දුම්රිය සේවය
කොළඹ 10.

**ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2024 වර්ෂය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

| |
|---|
| |

01. නම සම්පූර්ණයෙන් (වාසගම සමග) සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියන්න.

(සිංහලෙන්) :.....................................................................................................

(ඉංග්‍රීසියෙන්) :.....................................................................................................

02. ලිපිනය

(සිංහලෙන්) :.....................................................................................................

(ඉංග්‍රීසියෙන්) :.....................................................................................................

03. දිස්ත්‍රික්කය :............................................

04. උපන් දිනය : | | | | | | | | | | | | |

ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | | |

05. ස්ත්‍රී/පුරුෂ භාවය :.............................................

06. දුරකථන අංකය : 01. .............................. 02. .............................................

වට්ස් ඇප් අංකය (Whatsapp) :.............................................

විද්‍යුත් ලිපිනය (E-mail address) :.............................................

07. *අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා/පෙළ) :* වර්ෂය :————. විභාග අංකය :————.

| *අනු අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

08. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍ය :————.

09. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙහි නොගැලවෙන සේ අයදුම්පතට අමුණන්න.

10. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් පෙනී ගියහොත් එයින් නුසුදුස්සකු වීමටත් තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07-630

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ඉංජිනේරු තාක්ෂණ ආයතනය, කටුනායක

**තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා සඳහා ආධුනිකයන් බඳවා ගැනීම 2024 කණ්ඩායම (න්‍යායික අධ්‍යයන වාර ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී සහ ආයතනික අවශ්‍යතාව මත මාර්ග ගත ක්‍රමයට)**

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව - 2024 කණ්ඩායම සඳහා ආධුනිකයන් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

අයදුම්කරන අවස්ථාවේ දී පහත 1.1 හි හෝ 1.2 හි දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිටි උපරිම අවස්ථා ගණන තෙවරකට නොවැඩි විය යුතුය. එම එක් අවස්ථාවක දී පහත සඳහන් විෂය ධාරා වලින් එකකට අදාළ විෂයන් තුනම (03) සමත් විය යුතුය.

- භෞතික විද්‍යා විෂය ධාරාව (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව හෝ තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය)

- ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව (ඉංජිනේරු තාක්ෂණය සහ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයන් ඇතුළත්ව විෂයන් 03ක්)

- ජීව විද්‍යා විෂය ධාරාව (ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සහ රසායන විද්‍යාව)

- ජෛව පද්ධති තාක්ෂණ විෂය ධාරාව (ජෛව පද්ධති තාක්ෂණය සහ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයන් ඇතුළත්ව විෂයන් 03 ක්)

සහ

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී තෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

1.2 තෙවරකට නොවැඩි වාර ගණනක දී ලන්ඩන් උසස් පෙළ විභාගයේ (London Advanced Level Examination - Edexcel/Cambridge) ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුනම එකවරක දී සමත් වී තිබීම.

2. *ඉල්ලුම්කරුගේ වයස් සීමාව :*

2024.06.30 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතුය.
ඒ අනුව 2006.06.30 වැනි දිනට හෝ ඊට පෙර හා 1999.06.30 වැනි දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

3. *පුහුණු කිරීම් කාලය පිළිබඳ විස්තරය :*

මෙය පූර්ණකාලීන පාඨමාලාවකි.

පහත සඳහන් පරිදි මුළු පාඨමාලා කාලය මාස 18 කි.
- පළමු හා දෙවන න්‍යායික අධ්‍යයන වාර ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී - මාස 12
- කර්මාන්ත පුහුණුව බාහිර කර්මාන්ත ආයතන තුළදී - මාස 06

4. ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා පහත සඳහන් පරිදි වේ.

- සිවිල් ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණ ඩිප්ලෝමාව
- විදුලි සහ ස්වයංක්‍රියාකරණ ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණ ඩිප්ලෝමාව
- පරිගණක පද්ධති සහ ජාලගතකරණ ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණ ඩිප්ලෝමාව
- යාන්ත්‍රික ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණ ඩිප්ලෝමාව

5. *පාඨමාලා මාධ්‍යය :* - ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *සහතික ප්‍රදානය -*

සාර්ථක ලෙස පාඨමාලාවට අදාළ න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයන්හට ආයතනයට ඇති සියලුම බැඳීම් වලින් නිදහස් වූ පසු අදාළ ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

*සටහන :*
ඉදිරියේ දී ඉහත 4හි සඳහන් ක්ෂේත්‍රවලට අදාළව උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට ඉංජිනේරු තාක්ෂණ ආයතනය සැලසුම් කර ඇති අතර මෙම තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිමකර සහතිකය ලබා ගැනීම, අදාළ ක්ෂෙත්‍රයේ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව හැදෑරීමට අධ්‍යාපන සුදුසුකමක් ලෙස සලකනු ඇත.

7. *තෝරා ගැනීමේ ක්‍රමය :*

7.1 එක් පාඨමාලාවක් සඳහා එක් ශිෂ්‍ය කාණ්ඩායමකට අවම වශයෙන් සිටිය යුතු ආධුනිකයන් ප්‍රමාණයට වඩා අඩු අයදුම්කරුවන් ප්‍රමාණයක් යම් පාඨමාලාවක් සඳහා අයදුම්කර ඇති අවස්ථාවක් ඇති වුවහොත් එම පාඨමාලාව අදාළ වසර සඳහා ආරම්භ කිරීම හෝ නොකිරීම පිළිබඳ තීරණය ගැනීම ආයතනය සතුය.

7.2 යම් පාඨමාලාවකට අයදුම්කරුවන් ගණන එම පාඨමාලාවට ඇතුළත්කර ගැනීමට හැකි උපරිම මට්ටමට වඩා වැඩි වුවහොත් ආයතනය මගින් පවත්වනු ලබන තරග විභාගයක දී වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් 7.4 හි සඳහන් සම්මුඛ පරීක්ෂණයෙන් පසුව අදාළ පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

7.3 එලෙස 7.2 හි සඳහන් පරිදි තෝරාගැනීමේ තරග විභාගයක් පැවැත්වීමට සිදුවුවහොත් අදාළ අයදුම්කරුවන්ට එම විභාගය පිළිබඳව වැඩි විස්තර විභාගයට පෙර ආයතනය මගින් දැනුවත් කරනු ලබන අතර ආයතනය විසින් තීරණය කරනු ලබන විභාග ගාස්තුවකට යටත් වීමට සිදුවනු ඇත.

7.4 පාඨමාලාව හැදෑරීමේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා සියලු අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්හට සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමට සිදුවන අතර එම සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුන් පමණක් පාඨමාලාව සඳහා තෝර

ගනු ලැබේ. 7.2 හි සඳහන් පරිදි තරග විභාගයක් පැවැත්වුවහොත් එයින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර සම්මුඛ පරීක්ෂණයෙන් අසමත්වන අයදුම්කරුවන්ගේ ප්‍රමාණය අනුව අනෙකුත් අයදුම්කරුවන්ට ඔවුන් ලබා ගන්නා ලකුණු පිළිවෙල අනුව සම්මුඛ පරීෂණයට පෙනී සිටීමට අවස්ථාව හිමිවනු ඇත.

8. අයදුම්පත් :

8.1 අයදුම්පත් සැකසීමේ සහ පිරික්සීමේ ක්‍රියාවලිය සඳහා ගාස්තුව වන රු. 1,500.00 ක මුදල මහජන බැංකුවේ, කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ශිෂ්‍ය සුභසාධන ගිණුම් අංක 276-1-001-8-6351396 වෙත අයදුම්කරුගේ නමින් ගෙවිය යුතුය. (මෙම ගාස්තුව සහ ඉහත 7.3 හි සඳහන් විභාග ගාස්තුව, යනු ගාස්තු 2කි.) මෙම රු. 1,500.00 ක මුදල ගෙවීමට අදාළ මුල් ලදුපත (Original Slip) ඔබගේ අයදුම්පත සමග අමුණා ඉංජිනේරු තාක්ෂණ ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ ලදුපතේ අයදුම්කරුවන්ගේ මුලකුර සහිත නම, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය සඳහන් කර තිබීම සහ එම ලදුපත බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියකු විසින් සහතික කර තිබීම අනිවාර්ය වේ.

(ඉහත ගාස්තුව නිසි පරිදි ගෙවා නොතිබීම/වෙනත් අයකුගේ නමින් ගෙවීම් සිදු කිරීම/අයදුම්කරුගේ නොවන තොරතුරු ලදුපතෙහි සඳහන් කර තිබීම/මුල් ලදුපත බැංකු ශාඛාගේ බලයලත් නිලධාරියකු විසින් සහතික කර නොතිබීම වැනි කරුණු මත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරුවන් විසින් තම ලදුපතෙහි පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.2 ඔබගේ අයදුම්පත සමග අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපන සහතිකවල විදුහල්පති විසින් සහතික කරන ලද පිටපත් එවීම අනිවාර්ය වේ. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලියාපදිංචි වීමට තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ගේ අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපන සහතිකවල නිරවද්‍යතාවය පිටපත් විභාග දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂා කරනු ලැබේ. එම වියදම අයදුම්කරුවන් විසින් දැරිය යුතු වේ.

8.3 අයදුම්පත් සහ පාඨමාලා පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

8.4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත **2024.08.30** වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පරිපාලන නිලධාරි/ලේඛකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ආධුනිකයන් බඳවා ගැනීම -2024" ලෙස සඳහන් කල යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

8.5 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

10. *පාඨමාලා ගාස්තු :*
තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තුව - රු. 295,000.00

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා භෞතික විද්‍යා අංශයෙන් (ගණිතය අංශයෙන්) නොවන විෂය ධාරාවකින් පෙනී සිටි අයදුම්කරුවකු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තේරීපත් වුවහොත් පාඨමාලාව ආරම්භයේදී ඔහුට/ඇයට ගණිතය පිළිබඳ පදනම් පාඨමාලාවක් හදාරා එය සමත් විය යුතු අතර එම පාඨමාලාව සඳහා ඉහත ගාස්තුවලට අමතරව රු. 10,000.00 ක ගාස්තුවක් අයකරනු ඇත.

උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තුව පාඨමාලා ආරම්භ කිරීම සම්බන්ධ *ගැසට්* නිවේදනයේ දී දැනුම් දෙනු ලැබේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනය භාෂා පාඨ අතර යම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව පමණක් කටයුතු කරනු ලැබේ.

සභාපති,
තික ආධුනිකත්ව සහ
කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය

07-667

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කතෝලිකධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2024

### ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය

2020, 2021, 2022 හා 2023 වසරවලට නියමිත කතෝලික ධර්මාචාර්ය සහතිකපත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. විභාග මධ්‍යස්ථාන :- උපලේඛනය 01හි දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

3. *භාෂා මාධ්‍යය* :- මෙම විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි.

04. *සුදුසුකම්* :- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබීම.

4.2 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන ධර්මාචාර්ය විභාගය හෝ ධර්මාචාර්ය විශේෂ විභාගය හෝ ධර්මාචාර්ය ගෞරව විභාගය හෝ සමත් වී තිබීම.

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ.පො.ස (උ.පෙළ) විභාගයේ ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය යන විෂයයන් දෙකෙන් එකක්ද ඇතුළුව විෂයයන් තුනකින් සමත් වී තිබීම.

4.4 කතෝලික ධර්මය විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයේ විෂයයන් 06කින් සමත් වීම හෝ කතෝලික ධර්මය විෂයය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගය හෝ සමත් ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කතෝලික දහම් පාසලක වසරකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ආචාර්යවරයකු වීම.

*සටහන* :- මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම්වලින් එකක්වත් ලබා ඇති බවට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කතෝලික දහම් පාසල ප්‍රධානාචාර්යවරයකු හෝ මීසම්භාර පූජා ප්‍රසාදිතුමකු හෝ විසින් සහතික කොට අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

5. *අයදුම් කිරීම* :-

5.1 ලියාපදිංචි දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් තැපැල් මගින් මේ වන විට දහම් පාසල් වෙත යොමු කර ඇති අතර www.donets.lk වෙබ් අඩවිය මගින් ද බාගත කර ගැනීමේ පහසුකම සලසා ඇත.

5.2 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලු දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දී ඇත.

5.3 අයදුම්පත්වල අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වල දී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතුය. දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

5.5 අයදුම්කරුවන්ගේ අදාළ සුදුසුකම් ලබා තිබීම පිළිබඳව අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා හෝ පූජා ප්‍රසාදිතුමා හෝ වගකිව යුතුය.

5.6 2024 අගෝස්තු මස 26 වන දින අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන අතර එදිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ.

6. *විභාග ගාස්තු* :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200/-කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට අයදුම් කරන විෂයය සඳහා විභාග ගාස්තුව රු. 50/-කි.

6.1 විභාග ගාස්තු ගෙවීම :-අදාළ දහම් පාසලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලු අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු එකතු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා එක් ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

7. ප්‍රවේශ පත්‍ර :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශපත්‍රය භාර නොදී සිටී නම් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මීසම් භාර පූජා ප්‍රසාදිතුමා හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ රිසිට්පතේ ඡායා පිටපතක් සහිතව පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

1. විභාගයේනම :
2. දහම් පාසලේ නම :
3. දහම් පාසලේ ලිපිනය :
4. දහම් පාසලට ලබාදී ඇති පරිගණක අංකය :
5. අයදුම්කරුගේ සම්පූර්ණ නම:
6. අයදුම්කළ විභාග මධ්‍යස්ථානය/නගරය :

8. අනන්‍යතාව :- විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

9. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම:-

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයය ගණන පහක් වන අතර විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් පහම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂය පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි විභාග අවස්ථා තුනක් (3) ඇතුළතදී එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයයට පමණි.

9.2 සෑම විෂයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :

| ලකුණු පරාසය | ශ්‍රේණිය | සංකේතය |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.3 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. සහතික පත්‍ර :- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මගින් ලබා දෙනු ඇත. උක්ත විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණ යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව

දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ 1503, කොළඹ යන ලිපිනයට ලිපියක් මගින් විමසීම් කළ යුතුය.

11. උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :- දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් විභාග ප්‍රතිඵල නිකුත් වී දින 14ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

12. විභාගය පිළිබඳ විස්තර :-මෙම විභාගය ප්‍රශ්නපත්‍ර පහකින් (5) සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනක් (3) බැගින් වේ. එම ප්‍රශ්න පත්‍ර පහත දැක්වේ :

1. ශුද්ධ බයිබලය
2. ජන වන්දනාව හා දේව ප්‍රසාද නිධාන
3. සභා ඉතිහාසය (ලෝක හා ලංකා සභා ඉතිහාසය)
4. ධර්මෝපදේශය
5. සභාවේ සමාජ දර්ශනය (සභා ඉගැන්වීම)

13. ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය :-

- එක් එක් ප්‍රශ්න පත්‍රය I වැනි කොටස, II වැනි කොටස හා III වැනි කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- I වැනි කොටස කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10කින් සමන්විත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් එක් ප්‍රශ්නයට ලකුණු හතර (4) බැගින් හිමි වේ.(ලකුණු 4 x 10 = 40)
- II වැනි කොටස ව්‍යූහගත ප්‍රශ්න පහකින් සමන්විත වේ. ඉන් කැමැති ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සැපයිය යුතුය. එක් එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් හිමි වේ. (ලකුණු 12 x 4 = 48)
- III වැනි කොටස සඳහා රචනා වර්ගයේ ප්‍රශ්න දෙකක් (2) අඩංගු වේ. ඉන් කැමති එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුය.මෙම කොටස සඳහා ලකුණු 12ක් හිමි වේ. (ලකුණු 12 x 1 = 12)

14. විෂයය නිර්දේශය සහ මූලාකෘති ප්‍රශ්න පත්‍ර :-ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගයට අදාළ විෂයය නිර්දේශය සහ මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා "අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය, බැල්කම් පෙදෙස, කොටා පාර, කොළඹ 08." යන ලිපිනයෙන් හෝ 0112685459 විමසන්න.

15. මෙම ව්‍යවස්ථාව සහ විෂයය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලු විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

16. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර,
විභාග කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 26 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය 01

| දිස්ත්‍රික්ක / නගර අංකය | දිස්ත්‍රික්ක / නගර |
|---|---|
| 01 | කොළඹ |
| 02 | ගම්පහ |
| 03 | කළුතර |
| 04 | මහනුවර |
| 05 | මාතලේ |
| 06 | නුවරඑළිය |
| 07 | ගාල්ල |
| 08 | මාතර |
| 09 | හම්බන්තොට |
| 10 | යාපනය |
| 11 | මන්නාරම |
| 12 | වව්නියාව |
| 13 | මුලතිව් |
| 14 | කිලිනොච්චිය |
| 15 | මඩකලපුව |
| 16 | අම්පාර |
| 17 | ත්‍රිකුණාමලය |
| 18 | කුරුණෑගල |
| 19 | පුත්තලම |
| 20 | අනුරාධපුරය |
| 21 | පොළොන්නරුව |
| 22 | බදුල්ල |
| 23 | මොනරාගල |
| 24 | රත්නපුර |
| 25 | කෑගල්ල |

07-659

### ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණය) සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 නොවැම්බර් මස කොළඹ දී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024 ජූලි 26 වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වී 2024 අගෝස්තු 23 වැනි දින ප.ව.9.00** ට අවසන් වේ.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ) සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) තනතුරෙ හි පවතින පුරප්පාඩු 03ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම තනතුරෙහි පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/ අණදීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ථ කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරාදෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

01. *සේවා කොන්දේසි* :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

II. තෝරාගත් අයදුම්කරුවන් පත්වීම් දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ව පත් කරනු ලැබේ.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව,නියමිත අනෙක් භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ .

02. *වැටුප් කාණ්ඩය සහ පරිමාණය* :

වැටුප් කේත අංකය : SL 1 - 2016
වැටුප් පරිමාණය : රු. 47,615 - 10×1,335-08×1,630-17×2,170- රු. 110,895

03. *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද* :

සත්ත්ව විද්‍යාව, ජීව විද්‍යාව, මත්ස්‍ය ජීව විද්‍යාව, සමුද්‍ර ජීව විද්‍යාව, ධීවර ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ආහාර විද්‍යාව යන විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

04. *වෘත්තිය සුදුසුකම්* : විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

05. *පළපුරුද්ද* : විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

06. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. *වෙනත්* :

(i) සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසාන දිනට ප්‍රථම සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවකු වේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(v) මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

08. වයස් සීමාව :
ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව,

වයස සම්බන්ධව සුදුසුකම් සපුරාලනුයේ උපන් දිනය **2003.08.23 දින හෝ ඊට පෙර හා 1989.08.23 දින හෝ ඊට** පසුව යෙදී ඇත්නම් පමණි.)

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :

සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) තනතුරු සඳහා ලිඛිත විභාගයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125% ක පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලිඛිත විභාගයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලු ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. *ලිඛිත විභාගය* :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය බුද්ධිය මැනීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටලු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසරය, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනීම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. |

11. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

12. *විභාග ගාස්තුව* :

විභාග ගාස්තුව රු.1,200/-කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන* :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් ( SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ආයතන ප්‍රධානියාගේ එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව මෙම විභාගය සඳහා අයදුම් කළ යුතු අතර ලිඛිත විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අවස්ථාවේදී ඔහු / ඇය දැනට දරන සේවයෙන් /තනතුරෙන් නිදහස්

කළ හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

14. විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම :

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද මාර්ගගතව අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වු පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ඵලදායි වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේදී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම දැන්වීමේ පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. *සැලකිය යුතුය* :

(අ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) දැනට රාජ්‍ය සේවයේ තනතුරක් දරන සියලුම අයදුම්කරුවන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු අතර සෑම අයදුම්කරුවකුම තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

17. *ප්‍රතිඵල නිකුත් කිරීම* :

ලිඛිත පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළිවෙළට සකස් කළ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනුම් දීම පරිදි නියම කරන ලද පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියෙන් පසු විභාග යට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

18. සාවද්‍ය තොරතුරු සැපයීම :
අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

19. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ,
ලේකම්.

2024 ජූලි මස 22 වැනි දින,
ධීවර අමාත්‍යාංශය
මාලිගාවත්ත,
කොළඹ 10.

07-686

---

## ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණය) සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්/තාක්ෂණ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්/ තාක්ෂණ) තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2024 නොවැම්බර් මස කොළඹ දී** පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024 ජූලි 26 වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2024 අගෝස්තු 23 වැනි දින රාත්‍රී 9.00 ට** අවසන් වේ.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ) සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) තනතුරෙහි පවතින පුරප්පාඩු 08ක් සහ සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරෙහි පවතින පුරප්පාඩු 01ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම තනතුරෙහි පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/ අණදීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරාදෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

01. *සේවා කොන්දේසි* :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු පරිවාස කාලසීමාවකට යටත් වේ .

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

02. *වැටුප් කාණ්ඩය සහ පරිමාණය* :

වැටුප් කේත අංකය : SL 1 - 2016
වැටුප් පරිමාණය : රු. 47,615 - 10×1,335-08×1,630-17×2,170-රු. 110,895

03. *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද* :

I. *සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්)*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

*සහ*

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන නිලධාරි, වැඩසටහන් සහකාර, ධීවර නිලධාරි, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර බලපත්‍ර නිලධාරි යන තනතුරු ස්ථිර කරනු ලැබ ඇති අවුරුදු 05 ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සපුරා ඇති නිලධාරියකු වීම;

*හෝ*

(ආ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සංවර්ධන නිලධාරි සේවයේ තනතුරක ස්ථිර කර ඇති නිලධාරියකු වීම;

*හෝ*

(ඇ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සිටින ධීවර පරීක්ෂක, ධීවර නිලධාරි, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර බලපත්‍ර නිලධාරි යන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවුරුදු 10ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සපුරා ඇති නිලධාරියකු වීම.

II. **සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන ඉලෙක්ට්‍රෝනික හා විදුලි සංදේශ ඉංජිනේරු උපාධියක් හෝ විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම;

*සහ*

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි, ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරි හෝ ප්‍රධාන ගුවන් විදුලි නිලධාරි යන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවුරුදු 05 ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සපුරා ඇති නිලධාරියකු වීම;

*හෝ*

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගයේ පැරණි නිර්දේශය යටතේ නම් අවම වශයෙන් විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් 3ක් සමත් වීම හෝ නව නිර්දේශය යටතේ නම් අවම වශයෙන් විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් 3ක් සමත් වීම;

*සහ*

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි, ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරි හෝ ප්‍රධාන ගුවන් විදුලි නිලධාරි යන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවුරුදු 10ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සපුරා ඇති නිලධාරියකු වීම;

*හෝ*

(ඇ) ඉංග්‍රීසි භාෂාව, සිංහල භාෂාව, ගණිතය හා භෞතික විද්‍යාව විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ එම විෂයයන් ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය අවම වශයෙන් විෂයයන් 06 කින් සාමර්ථයන් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම;

*සහ*

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි, ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරි හෝ ප්‍රධාන ගුවන් විදුලි නිලධාරි යන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවුරුදු 15 ට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සපුරා ඇති නිලධාරියකු වීම.

04. *වෘත්තීය සුදුසුකම්* : අදාළ නොවේ.

05. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

06. *වෙනත්* :

I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න සේවයේ යෙදී සිටි වසර 05ක සේවා කාලය තුළ අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

07. *වයස් සීමාව* : අදාළ නොවේ.

08. *බඳවා ගැනීමේ ක්‍රමය :*

I. සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්), සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරු සඳහා ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් අතරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් 125% ක පිරිසක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යන දෙකේම ඒකාබද්ධ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

II. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

III. බඳවා ගැනීමේ තරග විභාගය සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පවත්වනු ඇත.

IV. බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙ හි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

09. *ලිඛිත විභාගය :*

| *තනතුර* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) | 01. ධීවර පනත හා රෙගුලාසි | පැය 3 | 100 | 50% |
| | 02.කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති | පැය 2 | 100 | 40% |
| | 03.මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |
| සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) | 01.ධීවර පනත හා රෙගුලාසි/ විදුලිය හා ගුවන් විදුලි සම්ප්‍රේෂණය පිළිබඳ දැනුම | පැය 3 | 100 | 50% |
| | 02.කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති | පැය 2 | 100 | 40 % |
| | 03.මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40 % |

9.1 *විභාගය සඳහාවන විෂය නිර්දේශය :*

| *තනතුර* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (ධීවර හා ජලජ සම්පත්) | 01.ධීවර පනත හා රෙගුලාසි | I. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා ඊට අදාළ සියලු සංශෝධන පනත් හි සඳහන් විධිවිධාන සම්බන්ධ මූලික දැනුම<br>II. වරින්වර පනවා ඇති ධීවර නියෝග සම්බන්ධ දැනුම යන කරුණු මැන බැලීම අපේක්ෂා කරනු ලැබේ. |
| | 02.කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති | රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.<br><br>ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරමින් කාර්යාල කළමනාකරණයේ දී වැදගත්වන ආයතන කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකිවන පරිදි සකස් කරනු ලැබේ. |

| *තනතුර* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| | | VII වන පරිච්ඡේදය - වැටුප්<br>IX වන පරිච්ඡේදය - ගාස්තු<br>XII වන පරිච්ඡේදය - නිවාඩු<br>XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXXI වන පරිච්ඡේදය - සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XXXII වන පරිච්ඡේදය - දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XLV වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br>XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය**<br>III වන පරිච්ඡේදය - පත් කිරීම්<br>IV වන පරිච්ඡේදය - සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි<br>VI වන පරිච්ඡේදය - පත්කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි<br>VIII වන පරිච්ඡේදය - පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම<br>XII වන පරිච්ඡේදය - රජයේ නිලධාරියෙකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම<br>XVI වන පරිච්ඡේදය - සේවය දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම |
| | 03. මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. මේ සඳහා මුදල් රෙගුලාසි සංග්‍රහයේ පළවන කාණ්ඩයේ I සිට IX දක්වා. |
| සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) | 01. ධීවර පනත හා රෙගුලාසි /විදුලිය හා ගුවන් විදුලි සම්ප්‍රේෂණය පිළිබඳ දැනුම | I. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා ඊට අදාල සියලු සංශෝධන පනත් හි සඳහන් විධිවිධාන සම්බන්ධ මූලික දැනුම<br>II. වරින් වර පනවා ඇති ධීවර නියෝග සම්බන්ධ දැනුම යන කරුණු මැන බැලීම අපේක්ෂා කරනු ලැබේ.<br><br>*පහත සඳහන් කරුණු පිළිබඳ දැනුම මැනීම.*<br><br>1.*රිසීවරය*<br>A.M,F.M,N.M,SSB,CW අධි හෙටිරොඩයින් (superhetrodyne) කාර්යයන් හා පාලක<br><br>2. සම්ප්‍රේෂක - CW, AM, FM<br>විකාශන සංඥා භාර ගැනීම, මෝස් සංඥා යැවීම, බලධාරික සකස් කිරීමේ අදියර SWR-SWR මීටර් භාවිතයේ වැදගත්කම හා මොනික් හා ව්‍යාජ විකිරණ<br><br>3. *සම්ප්‍රේෂක මාර්ග සහ සටහන්*<br>අනුනය කරන හා සාමාන්තර කල මාර්ග බාධක<br><br>4. *අන්තන*<br>සිරස්, ද්විත්ව, යාගිඅන්තන, අන්තනවාසිය, උසෙහි බලපෑම,ධ්‍රැවීකරණය<br><br>5. *තරංග ව්‍යාප්තිය*<br><br>අයනිකරණය,අයන ගෝලයේ ස්ථර, සූර්යයලප, MUF, සූර්යය ලප, MUF, LUF, OTF අවධි සංඛ්‍යානය, පැනුම් දුර ප්‍රමාණය, පැනුම් කලාපය, එළදායි උස, අහස් තරංග, සෘජු තරංග හීන කිරීම |

| තනතුර | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| | | 6. *පණිවුඩ හුවමාරු කිරීමේ මූලිකාංග*<br>සයින් තරංග,තරංග කාලය, සංඛ්‍යාතය, ස්පීකරය, මයික්‍රපෝනය, පරිමාණමකය, විවිධ ප්‍රතිග්‍රහණය, ඩෙසිබෙල්, බැටරි නඩත්තු ප්‍රතිරෝධය, ධාරිතාබලය හා ආනයිතය<br><br>7.මිනුම් උපකරණ<br>VOM තාප විද්‍යුත් යුගිම මීටර, කපාට වෝල්ට් මීටරය, අවපාතික මීටරය, SWR මීටරය RF වොල්ට් මීටරය. මෙගර්<br><br>8.පරිපථ හා ඇමුණුම් උපකරණ<br>ට්‍රාන්සිස්ටර් ක්‍රියා කරවීමේ මූලධර්ම,ට්‍රාන්සිස්ටර් ක්ෂේත්‍රඵලය,ලෝහ ඔක්සයිඩ් අර්ධවාහන ට්‍රාන්සිස්ටර්, කපාට AF හා RF විකාශන යන්ත්‍රවල සරල පරිපථ ඇතුළුව මූලික පරිපථ කාර්යයන්, දෝලකය, මිශ්‍රකය, බල සැපයුම් සංඛ්‍යාත ගොනු කිරීම පිළිබඳ දැනුම, යන කරුණු මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කීපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. |
| | 02.කාර්යාල ක්‍රම,ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති | රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.<br>ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරමින් කාර්යාල කළමනාකරණයේදී වැදගත් වන ආයතන කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකිවන පරිදි සකස් කරනු ලැබේ. :<br>VII වන පරිච්ඡේදය - වැටුප්<br>IX වන පරිච්ඡේදය - ගාස්තු<br>XII වන පරිච්ඡේදය- නිවාඩු<br>XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXXI වන පරිච්ඡේදය - සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XXXII වන පරිච්ඡේදය - දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XLV වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br>XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති<br><br>*රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය*<br>III වන පරිච්ඡේදය -පත් කිරීම්<br>IV වන පරිච්ඡේදය - සේවා ව්‍යවස්ථාව හා බඳවා ගැනීමේ පරිපාටි<br>VI වන පරිච්ඡේදය- පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි<br>VIII වන පරිච්ඡේදය- පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම<br>XII වන පරිච්ඡේදය- රජයේ නිලධාරියකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම<br>XVI වන පරිච්ඡේදය - සේවය දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම |
| | 03.මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. මේ සඳහා මුදල් රෙගුලාසි සංග්‍රහයේ පළමු කාණ්ඩයේ I සිට IX දක්වා අදාල වේ. |

10. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ. :

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

II. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එක් එක් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br><br>එක් එක් තනතුරෙ හි ක්ෂේත්‍රයට අදාළව ලබාගෙන ඇති අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>(a) පශ්චාත් උපාධිය-<br>*විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරන ලද පශ්චාත් උපාධියක් විය යුතුය.<br>(b) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව-<br>* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරන ලද පාඨමාලාවක් විය යුතුය.<br>(c) ඩිප්ලෝමා (වසරක් හෝ ඊට වඩා වැඩි කාලසීමාවක් සහිත)<br><br>**සටහන** -a, b හා c අතුරින් උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 30<br><br>20<br><br>10 | 30 |
| 02. | වෘත්තීය සුදුසුකම් :<br><br>එක් එක් තතතුරෙ හි විෂයය ක්ෂේත්‍රයට අදාළව ලබා ගෙන ඇති වෘත්තීය සුදුසුකම් -<br>(a) අවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම සඳහා<br>(b) මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම සඳහා<br><br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරන ලද පාඨමාලාවක්/ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරන ලද පාඨමාලාවක් / ධීවර අමාත්‍යාංශය විසින් එක් එක් තනතුරෙහි විෂයය ක්ෂේත්‍රයට අදාළව විදේශ පාඨමාලා පිරිනමනු ලබන ආයතන ලෙස පිළිගත් ආයතනයකින් හදාරන ලද පාඨමාලාවක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)<br>**සටහන** - a හා b අතුරින් උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ | 10<br><br>06 | 10 |
| 03. | ක්ෂේත්‍රයට අදාළව අතිරේක පළපුරුද්ද :<br><br>ක්ෂේත්‍රයට අදාළව අතිරේක පළපුරුද්ද ලෙස සලකනුයේ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 ඡේදයේ ''අ", ''ආ" හා '''' හි සඳහන් තනතුරුවල පළපුරුද්ද පමණි. මූලික සුදුසුකම් ඉක්මවූ සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 ඡේදයේ ''ආ" සහ ''ඇ"යටතේ සඳහන් අයදුම්කරුවන් සඳහා වසර 05 ක්ද ''ඇ" යටතේ සඳහන් අයදුම්කරුවන් සඳහා වසර 10 ක් ද මූලික සුදුසුකම් ලෙස සලකනු ලැබේ.<br>i. අතිරේක සෑම සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින්<br>ii. අතිරේක සෑම සතුටුදායක සේවා කාලය මාස 06 සිට වසරකට ලකුණු 01 බැගින්<br><br>**සටහන** - මාස 06ට අඩු සේවා කාලයන් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. | | 20 |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04. | පරිගණක සාක්ෂරතාව :<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් සඳහා<br><br>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්<br><br>(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලා හදාරා/පුහුණු වැඩසටහන්වලට සහභාගි වී ලබාගත් සහතික පත්‍ර.<br><br>(එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබාදෙනු ලැබේ.)<br>**සටහන :** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 20<br><br>16<br><br>10<br><br>08 | 20 |
| 05 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය සඳහා<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින් /රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක් සඳහා<br><br>(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ , TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL -PBT 550 හෝ ඊට ඉහළ වීම.<br><br>(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්<br><br>**සටහන :** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 15<br><br>10<br><br>08<br><br>05 | 15 |
| 06. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 05 |
| | මුළු ලකුණු | | 100 |

12. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 1,200/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

සටහන :

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

12. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :
මාර්ගගත (Online)විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ආයතන ප්‍රධානියාගේ එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව මෙම විභාගය සඳහා අයදුම් කළ යුතු අතර ලිඛිත විභාග යෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අවස්ථාවේ දී ඔහු / ඇය දැනට දරන සේවයෙන් /තනතුරෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

13. විභාගයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබීම :

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාග යට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ද අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම ඵලදායි වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියමකර ඇති විභාග ශාලාවේදී පමණක් විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකු ම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල් පිටුවල පළකර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

14. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාගශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍ර ය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15. **සැලකිය යුතුය :**

අ.) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

ආ.) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

දැනට රාජ්‍ය සේවයේ තනතුරක් දරන සියලුම අයදුම්කරුවන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ග යෙන් අයදුම්පත් එවිය යුතු අතර සෑම අයදුම්කරුවකුම තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

16. ප්‍රතිඵල නිකුත් කිරීම :
ලිඛිත පරීක්ෂණයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළිවෙළට සකස් කළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනුම් දීම පරිදි නියම කරන ලද පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් වූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

17. සාවද්‍ය තොරතුරු සැපයීම :
අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත්කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

18. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

19. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ,
ලේකම්,
ධීවර අමාත්‍යාංශය.

2024 ජූලි 22 වැනි දින,
ධීවර අමාත්‍යාංශය,
මාලිගාවත්ත,
කොළඹ 10.

07-687

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන
තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 (2024)

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024 ඔක්තෝබර් මස ආරම්භ කොට පේරාදෙණියේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2024.08.23 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පිළිබඳ විස්තරය - ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ජේදයේ විධිවිධාන අනුව එහි පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | 01 කළමනාකරණ මූලධර්ම<br>02 කළමනාකරණ ශ්‍රිතයන්<br>03 කළමනාකරණ පරිසරය<br>04 සහභාගිත්ව කළමනාකරණය<br>05 මහජන සම්බන්ධතා<br>06 යහ පාලනය<br>07 ආචාර ධර්ම |

සාමාර්ථ්‍යය සඳහා ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

04. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. ඉල්ලුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුවේ.

06. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

07. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති මෙම විභාගය සඳහා ද ක්‍රියාත්මක වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර 2024 අගෝස්තු 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් සඳහා කිසිදු විභාග ගාස්තුවක් අය නොකෙරේ. එතකුදු වුව ද දෙවන වර පෙනී සිටින නිලධාරින් විසින් විභාග ගාස්තු ලෙස රු.600/= ක් ගෙවිය යුතුයි. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 - 99 - 00 ආදායම් ශිර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළග තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිඳු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

10. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතුය. එහිදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළග තබාගත් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් එලදායි වනු ඇත.

11. ඉහත 09 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සළකා බලනු නොලැබේ.

12. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. ඉල්ලුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකුලතාවක් ඇත්නම් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ආචාර්ය. කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2024 ජූලි මස 17 වැනි දින.

ආදර්ශ අයදුම්පත

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන
තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022(2024)
THE THIRD EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN THE
SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE - 2022(2024)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙලවරේ දැක්විය යුතුය)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී - 1

පුරුෂ - 0

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකථන අංකය :

06. මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.
..........................................................................................................
..........................................................................................................

07. උපන්දිනය : වර්ෂය මාසය දිනය

08. පදවි නාමය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. දෙපාර්තමේන්තුවේ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

10. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 ශ්‍රේණියට පත් කරන ලද දිනය :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු. ..............................

ගෙවන ලද කාර්යාලය :————. රිසිට්පත් අංකය :————.

| |
|---|
| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

දිනය :————. අපේක්ෂකයාගේ අත්සන :————.

.........................................................................මගින්,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

දිනය :————. ————,
*ආයතන ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න.)

(* අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /පළාත් සභාවේ / නගර සභාවේ / අංශයේ ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.)

07-688

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

## රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

## ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2024 වර්ෂය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.**

---

- **පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ මාස දෙකක පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක් ව පවතින ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. මාස 2ක පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් පුහුණු රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

- **මයික්‍රොසොෆ්ට් ඔෆීස් සහ මූලික ග්‍රැෆික්ස් සිද්ධාන්ත - Microsoft Office with Essential Graphics**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, MS Office ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳ දැනුමක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දෙන අතර මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන් හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

- **පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 25,000 NVQ IV සහතිකපත් පාඨමාලාව රු. 45,000

---

- **පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

- **වෙබ් අඩවි නිර්මාණකරණ උසස් පාඨමාලාව - Advanced Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

- පොත් බැඳීම හා නිමාකරණය - **Book Binding & Finishing**

- පොත් බැඳීම - **Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ඵලදායී පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000
NVQ පාඨමාලාව : රු. 65,000

---

- අරේඛීය සංස්කරණ උසස් පාඨමාලාව - **Advanced Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

---

- ත්‍රිමාණ සජීවීකරණ උසස් පාඨමාලාව - **Advanced 3D Modelling and Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

---

- පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - **Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර, එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. මෙම පාඨමාලාවේ විශේෂත්වය වන්නේ Laptop අලුත්වැඩියාව පිළිබඳව පුහුණුව ද ලබා දේ. නවකයන්ට මෙන් ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

---

- ඕෆ්සෙට් ලිතෝකරණය - **Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන් ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 35,000

---

- නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

---

- ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - **Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණයවන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

- **ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනයවන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 70,000

- **වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාට ම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 25,000

- **ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

- **පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත් වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

- **ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය හා සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ ද්විත්ව පුහුණු පාඨමාලාව**

**Training Programme in Digital Printing Technology and Multi Colour Offset Printing Technology**

මෙම පාඨමාලාව තුළින් නවතම ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය සහ සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ නවීනතම යන්ත්‍ර ආශ්‍රයෙන් පුහුණු කරනු ලැබේ. විදේශ රැකියා අපේක්ෂිත තරුණයන් සඳහා ම මෙම පාඨමාලාව විශේෂයෙන් ම සැකසී ඇත.

සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් මෙම පුහුණු පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස් කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකතන : 011 2686162, 011 2679791, 071 9716655, 071 6432943**
**ෆැක්ස් : 011 2686162**
**ඊ-මේල් : sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය : www.sliop.edu.lk**

**ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.**
**දුරකතන අංක : 066 2222172, 071 0554298.**

07 - 000

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.